# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 43 දරන
# පුරවැසි (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 සැප්තැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 සැප්තැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 43 දරන පුරවැසි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 සැප්තැම්බර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 57/91

පුරවැසි පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1993 අංක 43 දරන පුරවැසි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

349 වන අධිකාරයේ 13අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරවැසි පනතේ 13 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 13අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයක ලියාපදිංචි කර ඇති තැනැත්තන් පුරවැසියන් වශයෙන් ලියාපදිංචි කිරීම.

13අ. (1) ආගාමික හා විගාමික පනතේ III වන කොටස යටතේ අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වීසා බලපත්‍රයක් හෝ පිටසනක් ප්‍රදානය කරනු ලැබ ඇති සහ විදේශ ආයෝජකයන් සහ වෘත්තිකයන් සඳහා ආණ්ඩුව විසින් අනුමත කරන ලද නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයක ලියාපදිංචි කර ඇති යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා නියමිත ආකාරයෙන් අමාත්‍යවරයා වෙත කරන ලද ඉල්ලීමක් මත—

(අ) (i) ඔහු රටේ ආර්ථික සංවර්ධනයට අර්ථවත් ලෙස දායක වී ඇති බවට; හෝ

(ii) ඔහු විද්‍යාව, අධ්‍යාපනය, වෛද්‍ය විද්‍යාව, පුරාවිද්‍යාව, සංගීතය, සාහිත්‍යය, කෘෂිකර්මය හෝ විනෝද ක්ෂේත්‍රවල දී රටේ සාමාජික හා සංස්කෘතික ජීවිතයට වැදගත් අන්දමින් දායක වී ඇති බවට; සහ

(ආ) නියමිත කාලපරිච්ඡේදය සඳහා ඔහු ශ්‍රී ලංකාවේ වාසය කර ඇති බවට සහ සාමාන්‍යයෙන් ඔහු ශ්‍රී ලංකාවේ වාසය කරන බවට හෝ එසේ නොකඩවා වාසය කිරීමට අදහස් කරන බවට

අමාත්‍යවරයා සෑහීමට පත්වුවහොත්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් ලියාපදිංචි කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාව යම් වර්ෂයක දී දෙසියය නොඉක්මවිය යුතු අතර, සමස්ත සංඛ්‍යාව එක් දහස නොඉක්මවිය යුතු ය.

(3) විදේශ ආයෝජකයන් සහ වෘත්තිකයන් සඳහා ආණ්ඩුව විසින් අනුමත කරන ලද නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයක් යටතේ යම් තැනැත්තකු ලියාපදිංචි වී සිටීමේ සිද්ධිය නිසා මේ වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ඒ තැනැත්තා ලියාපදිංචි කිරීමේ අයිතියක් ඔහු වෙත පැවැරෙන ලෙසට තේරුම් නොගත යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ යම් තැනැත්තකුගේ ඉල්ලීමකට අවසර දීම මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම, අවසානාත්මක විය යුතු අතර, යම් අධිකරණයක දී විවාදයට භාජනය කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "13 වන වගන්තිය" යන වචන හා ඉලක්කම් වෙනුවට, "13 වන වගන්තිය හෝ 13අ වගන්තිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.